The President was of the view that all development work which are not in progress should be completed soon with public life and economic activities returning to normal in all districts.

The President also emphasized that these development activities should continue without obtaining foreign loans and in compliance with the national policy.

The President also focused on the early commencement of development activities in the Eastern and Western terminals of Colombo Port at this meeting.

The discussion also focused on identifying and acquiring lands for development projects and construction of housing projects targeting low middle and upper income groups.

It was also discussed at this meeting to build housing units with all amenities targeting those coming from overseas for long-term stays. These housing units are to be given to them on a rental basis.

The President directed the officials to start all projects and construction of large buildings in the Colombo city and adjacent areas which have been stopped due to various reasons after having discussions with the relevant parties.

It was also discussed to expedite the construction of the road network connecting the Colombo city and several other cities. The President emphasized the environmental safeguards should be observed in all development projects.

The President has earlier stressed the need for a new economic model for Sri Lanka, post-COVID 19. The Presidential Task Force in charge of Economic Revival and Poverty Eradication has been entrusted with the responsibility of formulating a new economic model to achieve this objective. President Rajapaksa directed that the Task Force should prepare economic plans with specified targets in different areas. The President has pointed out that foreign investment and exports should be priority areas, which would also help the country to refrain from containing foreign loans to a great extent.

He has noted that agriculture, local industry and manufacture (including apparel), high-end tourism, higher education and indigenous medicine should be given prominence in such an economic model. Import substitution was also discussed at length.

Ministry Secretaries, officials representing the institutions coming under the Urban Development Authority, Road Development Authority, Board of Investment and Sri Lanka Ports Authority participated in this meeting.

**Newspaper – The Island     Date – 12-05-2020**

# HIP helps Hambantota District General Hospital to prevent spread of COVID-19




On a request made to the Hambantota International Port Group (HIPG) the port donated much needed Personal Protective Equipment (PPE) to the District General Hospital in Hambantota, during the months of March and April.

5200 surgical face masks and gloves, 500 N90 masks, and 50 Personal Protective Suits were handed over by port officials recently, to Dr. Suranga Ubeysekara, Medical Director of the District General Hospital.

Tissa Wickramasinghe, Chief Operating Officer of HIPG, Yongzhuang Li, Designate General Manager - Policy & Strategy Planning, Jeevan Premasara, General Manager HR and members of the management of HIPG were present at the occasion.

The District General Hospital of Hambantota is a screening center for COVID-19 infections and has a separate ward to treat patients.

CLIPPINGS

**Newspaper – Daily FT    Date – 13-05-2020**

# President spearheads urban development drive

- **Instructs to resume all large-scale building constructions, expedite work on road networks**
- **Stresses to fast-track East and West terminals of Colombo Port**



President
Gotabaya Rajapaksa

PRESIDENT Gotabaya Rajapaksa has instructed officials to focus on rapid development of several main cities in the country, including Colombo.

A discussion focused on infrastructure and urban development was held on Monday at the Presidential Secretariat with the participation of ministry secretaries, officials of the institutions affiliated to the Urban Development Authority (UDA), Road Development Authority (RDA), Board of Investment (BOI) and Sri Lanka Ports Authority (SLPA).

With the resumption to normalcy, the President pointed out it was necessary to accelerate the development activities which were interrupted due to the COVID-19 pandemic.

He also emphasised on the need to initiate new development activities to attract Foreign Direct Investment (FDIs) instead of seeking foreign loans.During the discussion, President stressed on the need to fast-track both East and West terminals of Colombo Port in the immediate future.

The President also instructed the officials to resume all the large-scale building construction and development work in the city of Colombo, which have been discontinued due to various reasons, in consultation with relevant parties.

A decision was reached to expedite the work of the proposed road network connecting Colombo and other cities.

It was also proposed to use unutilised lands on either side of the roads for eco-friendly cultivation activities.

In addition, a mechanism to facilitate acquiring lands for development projects as well as construction of houses for low, middle and high income families was also discussed.

The possibility of constructing housing schemes with all amenities and renting them out to the migrants was also explored.

Secretary to the President Dr. P.B. Jayasundera was also present at the discussion.

පුවත්පත - ලංකාදීප දිනය - 2020-05-13



# පිටරටට ණය නොවී ආයෝජනවලින් පමණක් නව සංවර්ධන වැඩ කළ යුතුයි

## - ජනපති නිලධාරීන්ට දැනුම්දෙයි

**Newspaper – Daily Mirror    Date – 13-05-2020**

# President instructs to focus on rapid development in main cities



A discussion centered on infrastructure and urban development was held at the Presidential Secretariat on Monday with the participation of Ministry Secretaries, officials of the entities affiliated to the Urban Development Authority, officials of Road Development Authority, Board of Investments and the Ports Authority.

The President said with the resumption of civilian life it was necessary to accelerate the development activities which were interrupted due to the pandemic. He emphasized the need to initiate new development activities by attracting investments instead of seeking foreign loans. The President pointed to the necessity of upgrading of East and West Terminals of the Colombo Port immediately. The nature of the mechanism that would facilitate acquiring lands for development projects was also discussed. Construction of houses for low, middle and high income families will also begin. The possibility of constructing housing schemes with all amenities and renting them out to the migrants was also explored.

President Rajapaksa has instructed the officials to resume all the large scale building construction and development work in Colombo which have been discontinued due to various reasons, in consultation with relevant parties.

During the discussion a decision was reached to expedite the work of the proposed road network connecting Colombo and other cities. It was proposed to use un-utilized lands on either side of the roads for eco-friendly cultivation activities.

Secretary to the President P.B. Jayasundera was also present at the discussion.

පුවත්පත - අද        දිනය - 2020-05-13

# විදෙස් ණය නොගෙන ආයෝජනවලින් පමණක් නව සංවර්ධන වැඩකටයුතු සිදුවිය යුතුයි

## ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ අවධාරණය කරයි



නිදර්ශනී වික්‍රමසිංහ

විදෙස් ණය නොගෙන ආයෝජනවලින් පමණක් නව සංවර්ධන වැඩකටයුතු සිදුවිය යුතු බවත්, එසේම ඒවා දේශීය ප්‍රතිපත්තියකට අනුකූල විය යුතු බවත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවධාරණය කර තිබේ.

හෙතෙම මේ බව අවධාරණය කර ඇත්තේ, අදාළ සැලසුම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියට අයත් ආයතන, මාර්ග සංවර්ධන අධිකාරිය, ආයෝජන මණ්ඩලය සහ වරාය අධිකාරිය යන ආයතනවල ඉහළ නිලධාරීන් මෙන්ම අමාත්‍යාංශ ලේකම්වරුන්ද සමග ජනාධිපති කාර්යාලයේදී පැවති සාකච්ඡාවකදීය.

කොළඹ වරායේ නැගෙනහිර සහ බටහිර පර්යන්ත සංවර්ධනය කඩිනමින් ආරම්භ කිරීම පිළිබඳ මෙම සාකච්ඡාවේදී විශේෂ අවධානයක් යොමුව ඇත. ඒ අනුව එම සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් හඳුනා ගනිමින් අත්පත් කර ගැනීමට හා අඩු, මධ්‍ය සහ ඉහළ ආදායම්ලාභීන් වෙනුවෙන් නිවාස ඉදිකිරීම සම්බන්ධවද සාකච්ඡා වී තිබේ.

මීට අමතරව විදේශයන්හි සිට පැමිණෙන පිරිස් ඉලක්ක කර ගනිමින් සියලු පහසුකම් සහිත නිවාස ඉදිකර කුලී පදනම මත ලබාදීමේ වැඩසටහනක් කෙරෙහිද අවධානය යොමුව ඇති අතර, ඒ අනුව විවිධ හේතූන් මත ඉදිකිරීම් නතර කර ඇති. කොළඹ නගරය ආශ්‍රිත සියලු මහා පරිමාණ ගොඩනැඟිලි සහ සංවර්ධන කටයුතු අදාළ පාර්ශ්ව සමග සාකච්ඡා කර කඩිනමින් යළි ආරම්භ ලෙසට ජනාධිපතිවරයා උපදෙස් දී ඇත.

කොළඹ සහ සෙසු නගර යා කරමින් ඉදිකිරීමට අපේක්ෂිත මාර්ග පද්ධතියේ වැඩකටයුතු වේගවත් කිරීමටත්, ප්‍රයෝජනයට නොගත් ඉඩම් හඳුනා ගනිමින් සංවර්ධනය කර ඇති ඇළ තීරු දෙපස පරිසර හිතකාමී කාම පටුමග ක්‍රියාත්මක කිරීමටත් මෙහිදී යෝජනා වී තිබේ.

CLIPPINGS

**Newspaper – Daily Mirror     Date – 13-05-2020**

# Late fees for containers stuck at Port

BY INDIKA SRI ARAVINDA

The Sri Lanka Ports Authority (SLPA) has decided to charge a late fee to clear containers stuck at the Colombo Port.

SEE REST OF THE STORY ON A2 >>

# Late fees for containers stuck at Port

Several containers remained stuck at the Colombo port after strict curfew was in force in Colombo.

Sri Lanka Ports Authority, Additional Managing Director Upali De Zoysa told the Daily Mirror that the concessionary period granted by the government to clear the containers had expired on May 7 and a late fee would now be charged.

It has been suggested to double the charges if late fees were not paid within eight days, he said.

He further said that there were already around 15,000 containers and about 500 imported vehicles at the port. These containers had hindered port operations and therefore these containers should be cleared as soon as possible, he added.

The containers had been placed at the Colombo International Container Terminal (CICT), Jaya Container Terminal (JCT) and South Asia Gateway Terminals Ltd. (SAGT).

Among the items in the containers are perishables, electrical items, vehicles and vehicle spare parts imported by individuals and others.

CLIPPINGS

**Newspaper – Daily Mirror     Date – 14-05-2020**

# SLPA looks to go digital to up efficiency, curb corruption

- SLPA Chairman General Daya Ratnayake says employees resisting change
- Says a large portion of workforce not ready to work in a computerised environment
- Says politicised and unionised workforce has crippled efficiency and effectiveness

By Shabiya Ali Ahlam

The Sri Lanka Ports Authority (SLPA) yesterday stressed the urgent need for the entity to go digital but said it is faced with a major hurdle in doing so, as its workforce is resisting the changes in that direction.



Daya Ratnayake

With the COVID-19 pandemic continuing to challenge the manner in which businesses across the world operate, SLPA Chairman General (Retd.) Daya Ratnayake warned that if the necessary steps are not taken to move the operations on to a digital platform, it is likely to that the major sea port operations will not survive.

Although the need to make the transformation is acknowledged to be mandatory for survival and growth, the SLPA chief termed the digitisation journey of the Colombo port as "awkward".

"The story is awkward. Our workforce is still largely dependent on paperwork. Many segments of the workforce have been by and large politicised and unionised, thus crippling the efficiency and effectiveness of the port as a commercial organisation," said Ratnayake while speaking on the impacts of the coronavirus on the shipping industry.

He added that a large proportion of the workforce is not ready to work in a computerised environment, which leads to corruption and malpractices. "There has been no visionary strategic plan throughout. Instead, ad hoc policies and procedures have been practised from time to time, to deal with the day-to-day operations.

MORE ON P14

## SLPA looks...

The strategic importance of the Colombo harbour for shipping, given Sri Lanka's strategic location in the Indian Ocean, has not been done with serious calculations, in the past," Ratnayake added, while pointing out the entity's inefficiencies that have not been addressed over the years. However, he sounded optimistic in transforming the SLPA for the better in the coming years, as Sri Lanka "is now with a visionary leadership, catering to these aspects with vigour".

According to Ratnayake, less than 25 percent of the operations at the Colombo port is computerised, which stresses the need to digitise the entity, so that it can be transformed to a smart port.

For that, he said, a thorough study should be carried out in identifying which areas need to be immediately digitised, as opposed to attempting to transform all processes of the entity overnight.

"We should have a careful study into individual factors, internal factors and external factors and accordingly, identify the problematic areas first and the remedies for the same.

We need to change the age-old inefficient systems and processes and reorganise, restructure and re-engineer the components in the entire supply chain and where it is required," he said.

**Newspaper – Ceylon Today Date – 15-05-2020**

# SLPA launches guideline for eradicating COVID-19

The Sri Lanka Ports Authority (SLPA) launched its 'Guideline for Eradicating COVID-19' on 14 May, to maintain the safety of all those efficiently and effectively involved in the port's operations. The launch event was held at the Mahapola Ports and Maritime Academy (MPMA), under the patronage of SLPA Chairman, General Daya Ratnayake.

Expressing views on the prevention of the COVID-19 pandemic, General Ratnayake said that since the outbreak of the virus, much before its arrival in Sri Lanka, President Gotabaya Rajapaksa had recognised the seriousness of the health issue.

"The situation has now been managed successfully, but the epidemic has given rise to lasting challenges that require collective support to be overcome. This is not something that can be done by an individual or a specific group; we all have the same responsibility to overcome prevailing challenges due to this pandemic," he said.

He also said it was imperative to expedite the process for the future development of the port. "The port is the heart of the nation, the pivotal centre of the country. We have many challenges and opportunities as a result of this pandemic. To seize those opportunities, we have to work together with the utmost dedication," he added. Addressing the gathering, to brief the objectives of the SLPA Guideline for Eradicating COVID-19, SLPA Additional MD, Upali de Zoysa said that by following this guideline, the institution's foremost objective was to ensure the safety of the SLPA and all those involved in the operations of the ports.

The first copy of the SLPA Guideline for Eradicating COVID-19 was presented to the SLPA Chairman. On the advice of the top management and divisional heads, the guideline was prepared by a team of higher Executive Officers of the SLPA, headed by Additional MD, Upali de Zoysa. SLPA MD, Captain Athula Hewavitharana and several other senior officials of the SLPA were also present at the occasion.



**The first copy of the SLPA Guideline for Eradicating COVID-19 Pandemic being presented to SLPA Chairman, General Daya Ratnayake**

CLIPPINGS

පුවත්පත - සිළුමිණ දිනය - 2020-05-17

## වෙසක් පුන් පොහෝදා රාජකීය ආදි සිසුන් ගෙන් මහඟු පින්කමක්

# සුව විරුවන්ට කාමර 16කින් යුත් නේවාසිකාගාරයක් පරිත්‍යාග කරයි





“දින 17ක් වැනි කෙටි කාලයක් තුළ කාමර 16කින් යුත් නේවාසිකාගාරය ගොඩනගයි”



“රාජකීය විද්‍යාලයේ ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටුවා ඇති ආදි ශිෂ්‍ය සංගමය මෙහෙයවනු ලබන East cost පදනම මගින් මේ පරිත්‍යාගය කරයි.”



“නේවාසිකාගාරය ඉදිකිරීමේ සැලසුම් නිර්මාණය කළේ වරාය අධිකාරිය මගින්”

පුවත්පත - දිවයින      දිනය - 2020-05-18

# කොවිඩ්-19 මර්දනය වෙනුවෙන් වරාය අධිකාරියේ මාර්ගෝපදේශයක්



කොවිඩ් -19 වසංගතය තුරන් කිරීමේ මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා සහභාගී වූ නිලධාරී මහත්ම මහත්මීන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

වරායේ මෙහෙයුම් සඳහා සම්බන්ධ වන සියලුම දෙනාගේ ආරක්ෂාව තහවුරු කරමින් එම මෙහෙයුම් කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් යුතුව අඛණ්ඩව පවත්වා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සකස් කරනු ලැබූ කොවිඩ්-19 වසංගතය මර්දනය සඳහා වූ මාර්ගෝපදේශයද සුගියදා එළි දක්වනු ලැබිය. එය, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනයේදී සිදු විය.

එහිදී, මේ වන විට ශ්‍රී ලංකාව තුළ සාර්ථකව මැඩපවත්වා ගැනීමට හැකි වී ඇති කොවිඩ්-19 වසංගතය මර්ධනය පිළිබඳව සභාපති ජෙනරාල් රත්නායක මහතා මෙසේ අදහස් දැක්විය.

"මෙම වෛරසය පැතිරීම ආරම්භ වූ අවධියේ සිටම එනම් එය ශ්‍රී ලංකාවට පැමිණීමටත් පෙර ජනාධිපතිතුමා විසින් මෙහි ඇති බරපතළකම නිවැරදිව හඳුනා ගනු ලැබුවා. ඉන් පසු රට තුළ වෛරසයේ ව්‍යාප්තිය ආරම්භවීමත් සමග වඩාත් නිවැරදි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට හැකිවුණා. මේ නිසා අපට රටක් හැටියට ඉතාම ආඩම්බර වෙන්න පුළුවන් තත්වයක් මේ වන විට නිර්මාණය වෙලා තියෙනවා. එහෙත්, මෙම වසංගතය විසින් ලබාදී ඇති අභියෝග තව දුරටත් පවතිනවා. එම අභියෝග ජයගැනීමට අපි සියලු දෙනාගේම සහයෝගය ඉතාම වැදගත් වෙනවා. මේක තනි පුද්ගලයෙකුට හෝ එක් කණ්ඩායමකට පමණක් කිරීමට හැකි දෙයක් නෙමෙයි. මෙය අපි සියල්ලන්ටම එක හා සමාන වගකීමක් පැවරෙනවා.

"වරාය කියන්නේ ජාතියේ හදවත. මේක රැකුනොත් තමයි රට රැකෙන්නේ. වරායේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා වූ වැඩපිළවෙල කඩිනම් කිරීම අත්‍යවශ්‍යයි. මෙම වසංගත තත්වය නිසා ලැබුණු අභියෝග වගේම අවස්ථාත් රාශියක් අපට තියෙනවා. එම අවස්ථා ලබාගැනීම සඳහා අපි එකතුවෙලා ඉතාම අවංක කැපවීමෙන් කටයුතු කළ යුතුයි.

මෙහිදී අතිරේක කළමණාකාර අධ්‍යක්ෂක උපාලි ද සොයිසා මහතා ද උත්සව සභාව ඇමතීය.

අතිරේක කළමණාකාර අධ්‍යක්ෂක උපාලි ද සොයිසා මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කරන නිලධාරී මහත්ම මහත්මීන් කණ්ඩායමක් විසින් ඉහළ කළමණාකාරීත්වයේ සහ කොට්ඨාශ ප්‍රධානීන්ගේ මෙන්ම සේවක මහත්ම මහත්මීන්ගේ උපදෙස් සහ යෝජනා අනුව මෙම මාර්ගෝපදේශය සකස් කරනු ලැබිය.

රට තුළ පවතින වසංගත තත්වය සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය ආරක්ෂාවට ප්‍රමුඛත්වය දෙමින් සංවිධානය කළ මෙම හමුවට කළමණාකාර අධ්‍යක්ෂක කපිතාන් අතුල හේවාවිතාරණ ඇතුළු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉහළ කළමණාකාරීත්වයේ නිලධාරීන් සහ සේවක මහත්ම මහත්මීන් කිහිපදෙනෙකු මේ සඳහා සහභාගී වූහ.

CLIPPINGS

**Newspaper – Daily FT     Date – 18-05-2020**

# SLPA launches guideline for eradicating COVID-19

SRI Lanka Ports Authority's Guideline for Eradicating COVID-19 was launched on 14 May, to maintain the safety of all those efficiently and effectively involved in the ports operations. The event was held at the Mahapola Ports and Maritime Academy (MPMA) under the patronage of General Daya Ratnayake, Chairman of the Sri Lanka Ports Authority (SLPA).

Expressing views on the management of the COVID-19 pandemic, which has been handled successfully so far in Sri Lanka, SLPA Chairman General Daya Ratnayake said that since the outbreak of the virus, much before its arrival in Sri Lanka, the President had recognised the seriousness of the health issue. "The situation has now been managed successfully, but the pandemic has presented long-lasting challenges. Collective support is very important to overcome such challenges. This is not something that can be done by an individual or a specific group. We all have the same responsibility to overcome prevailing challenges due to this pandemic," he said.

He also said that it was imperative to expedite the process for the future development of the port. "The port is the heart of the nation, the pivotal centre of the country. We have many challenges and opportunities as a result of this pandemic. To seize those opportunities, we have to work together with the utmost dedication," he added. He also said that the support of all is an essential requirement at the very moment.

Addressing the gathering to brief on the objectives of the Sri Lanka Ports Authority's Guideline for Eradicating COVID-19, SLPA Additional Managing Director Upali de Zoysa said that the institution's foremost objective was to ensure the safety of the Sri Lanka Ports Authority (SLPA) and all those involved in the operations of the ports.

The first copy of the Sri Lanka Ports Authority's Guideline for Eradicating COVID-19 was presented to SLPA Chairman General Daya Ratnayake. On the advice of the top management and divisional heads, the guideline was prepared by a team of higher executive officers of the SLPA, headed by SLPA's Additional Managing Director Upali de Zoysa. SLPA Managing Director Captain Athula Hewavitharana and several other senior officials of the authority were also present on the occasion.



Chairman of Sri Lanka Ports Authority (SLPA) General Daya Ratnayake addressing the gathering at the launch of the 'SLPA Guideline for Eradicating COVID-19'



The first copy of the 'SLPA Guideline for Eradicating COVID-19' being presented to Sri Lanka Ports Authority (SLPA) Chairman General Daya Ratnayake



SLPA executive officers who participated in the preparation of the 'SLPA Guideline for Eradicating COVID-19' with SLPA Chairman General Daya Ratnayake

පුවත්පත - අරුණ        දිනය - 2020-05-20



# නාවික ක්ෂේත්‍රයේ ආදායම ඇ.ඩො.බිලියනයක් දක්වා වැඩිකරන සැලැස්මක්

## ජෙනරාල් දයා රත්නායක හෙළි කරයි

■ ශයාන කරුණා ගමගේ

නාවික ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ඉහළ නැංවීම ඔස්සේ එම ක්ෂේත්‍රයෙන් ලබන ආදායම වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් බිලියන 1 ක් දක්වා ඉහළ දැමීමට රජය සූදානම් වේ. මේ වනතෙක් එම ක්ෂේත්‍රයෙන් ලබන ආදායම ඇ.ඩො. මිලියන 300 කි.

නාවිකයන්ගේ රැකියා අවස්ථා ඉහළ නැංවීමට අවශ්‍ය නව සැලැස්මක් දැනටමත් සකස් කර ඇතැයි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති විශ්‍රාමික ජෙනරාල් දයා රත්නායක පවසයි.

ශ්‍රී ලංකාව සතුව නාවික යාත්‍රා 17,500 ක් පමණ පැවැතියද වසරකට සේවය ලබාදෙනු ලබන්නේ නාවිකයන් 5000 ක් පමණි. මෙම නාවිකයෝ 5000 වසරකට ඇමෙරිකානු ඩොලර් මිලියන 300 ක පමණ ඉපැයුම් රටට ගෙන එනු ලබති.

ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සංවිධානය කළ වැඩසටහනකට එක්වෙමින් සභාපතිවරයා සඳහන් කළේ රැකියා අවස්ථා ඉහළ නැංවීම ඔස්සේ මෙම ආදායම වාර්ෂිකව රුපියල් බිලියනයක් දක්වා පහසුවෙන් ඉහළ නැංවිය හැකි බවයි.

පුහුණුව ලත් නාවිකයනු විශේෂිත සහතිකයක් (හැඳුනුම් පතක්) දරන අතර එය දරන්නා අන්තර්ජාතික ප්‍රමුඛතාවක් ලබා නාවිකයන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ නීතිරීතිවලින් බැඳී සිටී. සැම වසරකම ශ්‍රී ලංකාව පසුකරන නැව්වලින් 2500 ක පමණ කාර්ය මණ්ඩලයකට ඇණවුම් පවතින අතර එම ඉල්ලුම් සැපිරීම සඳහා සකස් කළ අදාළ සැලසුම් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වෙත ඉදිරිපත් කරන බව විශ්‍රාමික ජෙනරාල්වරයා වැඩිදුරටත් සඳහන් කරයි.

පුවත්පත - අද        දිනය - 2020-05-20

# ගාල්ල වරාය 'ගෝලීය කාර්යමණ්ඩල හුවමාරු කේන්ද්‍රයක්' කිරීමට රජයේ අවධානය





■ සිදුරංගි විජේසිංහ

ගාල්ල වරාය 'ගෝලීය කාර්යමණ්ඩල හුවමාරු කේන්ද්‍රයක්' (Global crew exchange hub) ලෙස සංවර්ධනය කිරීමට රජයේ අවධානය යොමුව තිබේ.

සෞඛ්‍ය නිර්දේශවලට යටත්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කොට බලන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.

ඒ අනුව මෙහිදී දකුණු මුහුදු තීරය හරහා ගමනාගමනය කරන නැව්වල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් හට ගාල්ල වරායෙන් දිවයිනට ඇතුළු වීමට සහ ඉන් පිටවීමට ඇති හැකියාව පිළිබඳවද විමර්ශනය කෙරේ.

මීට සමගාමීව කොවිඩ් - 19 වෛරසයේ ව්‍යාප්තියත් සමඟ ලොව ප්‍රධාන පෙළේ රටවල් රැසක නාවික සමාගම්වලට උද්ගතව ඇති ශ්‍රමික පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකිකයන් යොමු කිරීමේ හැකියාව පිළිබඳවද ජනාධිපතිවරයාගේ අවධානය මේ වනවිට යොමුව තිබේ.

ඒ අනුව මේ පිළිබඳ වූ විශේෂ සාකච්ඡාවක් මෙරට ප්‍රධාන පෙළේ නාවික සමාගම් කිහිපයක නියෝජිතයන් සමඟ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ජනාධිපති කාර්යාලයේදී පැවැත්වී තිබිණි.

මෙහිදී අදාළ නාවික සමාගම් පෙන්වාදී සිටියේ, ගාල්ල වරායට නාවික සැතපුම් 10ක් දුරින් මුහුදු තීරයේ වෙළෙඳ නැව් 300කට අධික සංඛ්‍යාවක් දිනපතා යාත්‍රා කරන බවයි.

ලෝක නාවික ක්ෂේත්‍රයේ රැකියා නියුක්තිය ලක්ෂ 16ක් බවත්, ඒ අනුව එම මුළු සංඛ්‍යාවෙන් 01%ක් ශ්‍රී ලාංකිකයන් වෙත ලබාදීම පෙන්වාදී ඇති ජනාධිපතිවරයා, එසේම සිදුවූ වසරකට ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක් රටට උපයා දෙන බව සඳහන් කර ඇත.

ඒ අනුව එම පිරිස දෙගුණයකින් වැඩි කිරීමෙන් විදේශ විනිමය ආදායමද දෙගුණ කළ හැකි බව ඔහුගේ අදහස වී ඇත. එසේම ශ්‍රී ලංකාව තුළින් සේවා ප්‍රවර්ධනය කිරීම සඳහාද මෙය ඉවහල් කරගත හැකි බවට ජනාධිපතිවරයා පෙන්වාදී තිබිණි.

හෙතෙම වැඩිදුරටත් පෙන්වාදී ඇත්තේ, ගුණාත්මක අයගෙන් ඉහළ සේවාවක් සැපයීමේ හැකියාව පිළිබඳ වූ විශ්වාසය ලෝක නාවික සමාගම් අතුරෙහි තහවුරු කිරීමෙන් ශ්‍රී ලාංකිකයන්ට විදේශ නෞකාවල රැකියා අවස්ථා දියුණුකිරීමට වඩා පහසු හැකියාවක් පවතින බවයි. ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග, නාවික හමුදාපති වයිස් අද්මිරාල් පියල් ද සිල්වා, වරාය අධිකාරියේ සභාපති විශ්‍රාමික ජෙනරාල් දයා රත්නායක යන මහත්වරුන්ද මෙම සාකච්ඡාවට එක්ව ඇත.

**Newspaper – Ceylon FT Date – 20-05-2020**

# SL exploring crew transfers via Galle Port

## A new forex earner if done right

**By Mario Andree**

To utilise Sri Lanka's proximity to one of the busiest shipping routes in the world, the Government is considering developing the Galle Harbour in the Southern Province.

The Galle Port, with its unique position and layout was originally planned to be developed as a Yacht Marina Zone, facilitating sailors who enjoy travelling the world by their own boats.

Recently, the Navy assisted one such vessel that was stranded at sea, with two travellers aboard left unable to procure resources due to the worldwide COVID-19 lockdowns. However, with many vessels seeking assistance to return their sailors to their respective countries, due to many nations refusing to grant them entry over fears of COVID-19, Sri Lanka is considering exploring the option of crew transfers as a novel foreign exchange earner.

According to shipping companies, more than 300 trade vessels sail in close proximity to Galle Port daily, and regular transfers of sailors happen.

If Sri Lanka is to utilise this opportunity, the country can benefit with increased foreign exchange earnings, they said. During a discussion, President Gotabaya Rajapaksa explored the possibility of Sri Lankan youth finding employment in international shipping companies.

According to him, if the country manages to double its workforce in the industry, it could easily increase foreign exchange earnings from the sector.

According to statistics, Sri Lankan sailors contribute more than US$ 300 million to the national economy every year.



CLIPPINGS

පුවත්පත - දිවයින      දිනය - 2020-05-21

# ගාල්ල වරාය 'ගෝලීය කාර්ය මණ්ඩල හුවමාරු මධ්‍යස්ථානයක්' ලෙස සංවර්ධනය කෙරේ

<u>ලසිත දමින්ද</u>

ගාල්ල වරාය 'ගෝලීය කාර්ය මණ්ඩල හුවමාරු මධ්‍යස්ථානයක්' **(Global crew exchange hub)** ලෙස සංවර්ධනය කිරීමට රජයේ අවධානය යොමු වී තිබේ.

පවතින තත්ත්වය යටතේ සෞඛ්‍ය නිර්දේශවලට යටත්ව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව සොයා බලන ලෙසට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.

එසේම 'කොවිඩ් 19' ගෝලීය වසංගතයත් සමග ලෝකයේ ප්‍රධාන පෙළේ රටවල් රැසක නාවික සමාගම්වල උද්ගතව පවතින ශ්‍රමික පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකිකයන් යොමු කිරීමේ හැකියාව පිළිබඳව ද ජනාධිපතිවරයාගේ අවධානයට යොමුවී තිබේ.

දකුණු මුහුදු තීරය ඔස්සේ නැගෙනහිරට සහ බටහිරට යාත්‍රා කරන නැව්වල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන්ට ගාල්ල වරායෙන් දිවයිනට ඇතුළුවීමට සහ ඉන් පිටවීමට ඇති ඉඩ කඩ ද සොයා බලන ලෙසට ද ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිලධාරීන්ට උපදෙස් දී ඇත.

ගාල්ල වරායට නාවික සැතපුම් 10ක් ඈතින් මුහුදු තීරයේ වෙළෙඳ නැව් 300කට අධික සංඛ්‍යාවක් දිනපතා යාත්‍රා කරන බැවින් එම නැව්වල සේවයේ නිරත සෙසු රටවල කාර්ය මණ්ඩලවලට ද ශ්‍රී ලංකාවේ සිට සිය රටවලට ගමන් කිරීමට පහසුකම් සැලසීමෙන් විශාල විදේශ විනිමයක් උපයා ගැනීමට හැකියාව තිබෙන බව ද ශ්‍රී ජනාධිපතිවරයා ශ්‍රී ලංකන් ගුවන් සේවය ප්‍රවර්ධනයට ද මෙය ඉවහල් කරගත හැකි බව ද කීවේය.

ලෝක නාවික ක්ෂේත්‍රයේ ශ්‍රී ලාංකිකයන් දහසය දහසක් සේවය කරන බවද, ඔවුන් වසරකට ඇමෙරිකානු ඩොලර් මිලියන 300 ක් රටට උපයා දෙන බව ද, එම පිරිස දෙගුණයකින් වැඩි කිරීමෙන් විදේශ විනිමය ආදායම ද දෙගුණ කළ හැකි බව ද ජනාධිපතිවරයා සඳහන් කළේය.

පුවත්පත - අද දිනය - 2020-05-27

# කොළඹ වරායේ නැ. පර්යන්ත ඩො.බි.1.1ක ඉන්දු-ලංකා ගනුදෙනුව ගැන සාකච්ඡා කර එකඟතාවකට පැමිණිලා?



## - සමගි ජන බලවේගයේ හිටපු අමාත්‍ය අජිත් පී. පෙරේරා

**නවෝද්‍යා පවනි**

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියාවේ අයිතියට ලබාදීම පිළිබඳ ඩොලර් බිලියන 1.1ක ගනුදෙනුව ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අතර නායකයන් මේ වනවිට සාකච්ඡා එකඟතාවකට පැමිණ අවසාන බවට වාර්තා පළ වන බව හිටපු අමාත්‍ය අජිත් පී. පෙරේරා මහතා පැවසීය.

සමගි ජනබලවේගයේ කාර්යාලයේ ඊයේ (26දා) පැවැති මාධ්‍ය හමුවකදී ඒ මහතා මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අජිත් පී. පෙරේරා මහතා,

"කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියානු අයිතියට ලබාදීම පිළිබඳ ගනුදෙනුව ඩොලර් බිලියන 1.1ක්. ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අතර නායකයන් සාකච්ඡා කරලා එකඟතාවක් මත එය කතා කරගෙන තිබෙනවා කියලා අපට දැනගන්න ලැබිලා තිබෙනවා. සත්‍යය තත්ත්වය රටට හෙළි කළ යුතුයි. ඉන්දියානු අගමැතිවරයාත් මෙරට ජනාධිපතිවරයාත් අතර සිද්ධ වුණු ඒ දුරකථන සංවාදය අපි හෙළි කරගත යුතුයි.

එම සංවාදයේ අපට අහන්න ලැබුණේ සාරාංශයක් පමණයි. කොරෝනා මර්දන වැඩපිළිවෙළ ගැන සාකච්ඡා කළා කියලා විතරයි අපට දැනගන්න ලැබුණේ. එම සාකච්ඡාවේදී නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට ලබාදීම පිළිබඳ තීරණාත්මක සාකච්ඡාවක් ඇතිවුණු බව අපි දන්නවා. අපි රජයට කියනවා කරුණාකරලා ඒ ගැන හෙළිදරව් කරන්න. ඔබලා මොකක්ද කරන්න යන්නේ කියලා දැනගන්න ජනතාවට අයිතියක් තිබෙනවා.

ඒ වගේම බොහෝ දෙනාගේ අවධානය යොමු වෙලා තිබෙනවා මහ මැතිවරණය ගැන. කොහොම හරි මැතිවරණය තියලා, කවුරුහරි මැතිවරණය දිනලා, කොහොම හෝ ආණ්ඩුවක් පත් කරගන්න එක නොවෙයි තෙරෙන්න ඕනේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කියන්නේම 33 ව්‍යවස්ථාවෙන් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම. ඒ සඳහා භෞතික හා නෛතික පරිසරයක් තිබිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය පරිසරය ලබාදිය යුත්තේ ජනාධිපතිවරයායි" යනුවෙන්ද සඳහන් කළේය.

CLIPPINGS

පුවත්පත - අරුණ දිනය - 2020-05-26

# වරාය බහාලුම් නිෂ්කාශනයේදී ගැටලු සහගත තත්ත්වයක්

■ වරුණි පෙරමුණ

වරාය අංගණයෙන් ආනයනික භාණ්ඩ නිෂ්කාශනය කර ගැනීමේදී ගැටලු සහගත තත්ත්වයක් මතුව ඇති බව වරාය අධිකාරියේ සහකාර කළමනාකාර අධ්‍යක්ෂ උපාලි සොයිසා පැවසීය.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය සමග වරාය තුළ එක් රැස් වී ඇති බහාලුම් නිදහස් කර ගැනීමේදී එම පාරිභෝගිකයන් කුලී සහන ඉල්ලා සිටින බවද අතිරේක කළමනාකාර අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

මේ වනවිට වරාය අංගණය තුළ බහාලුම් 10,000ක් පමණ ඇතැයි වරාය අධිකාරිය අනාවරණය කළේය.

කොවිඩ් - 19 වසංගතය සමග ආනයනික භාණ්ඩ සීමා කරමින් පැනවූ ගැසට් නිවේදනයට අනුව බහාලුම් නිදහස් කර ගැනීමේදී දින 90ක් යනතුරු ආනයනික සමාගම්වලට මුදල් ගෙවීමට ඉඩප්‍රස්ථාව නොලද නිසා වරාය අංගණයෙන් බහාලුම් නිදහස් කර ගැනීමට අදාළ සමාගම්වලට සහ පුද්ගලයන්ට නොහැකි විය.

මෙම තත්ත්වයත් සමග වරාය තුළ බහාලුම් නිදහස් කර ගැනීමේදී ගැටලු මතුවී ඇතැයි වරාය අධිකාරියේ සහකාර කළමනාකාර අධ්‍යක්ෂවරයා පැවසුවේය. එසේම අද (26) සිට ඇදිරි නීතිය ඉවත් වුවද වරායන්හි සේවකයන් තුනෙන් එකක ප්‍රමාණයක් පමණක් දෛනික රාජකාරි සඳහා කැඳවා තිබේ. සහකාර කළමනාකාර අධ්‍යක්ෂ උපාලි සොයිසා සඳහන් කළේ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම අවශ්‍ය නිසා මෙලෙස සේවකයන් කැඳවීමට තීරණය කළ බවය.

එසේම අපනයන භාණ්ඩ ලෙස කාර්මිකාර්මික නිෂ්පාදන ඇතුළත් බහාලුම් 500ක් පමණ දෛනිකව අපනයන කරන බවද ඔහු වැඩිදුරටත් පැවසීය.

පුවත්පත - ලංකාදීප    දිනය - 2020-05-28

# ඉන්දියානුවන් 700ක් අරන් යන්න 31දා නැවක් කොළඹට

(තිළිණි ද සිල්වා සහ ඉන්දිකා රාමනායක)

**කටුනායක ගුවන්තොටුපොළ වසා දමා ඇති හෙයින් මෙරට වෙසෙන ඉන්දීය ජාතිකයන් 700 දෙනකු යළිත් ඉන්දියාවට රැගෙන යාම සඳහා ඉන්දියාවේ 'ජලශ්වා' නෞකාව මෙම මස 31 වැනි දින කොළඹ වරායට පැමිණීමට නියමිත බව විදේශ සබඳතා අමාත්‍යාංශය කියයි.**

මෙම සියලු දෙනා තමිල්නාඩු ප්‍රාන්තයේ ජනතාව බවත් ජූනි මස පළමුවැනිද මොවුන් මෙම නෞකාවෙන් තමිල්නාඩුව බලා පිටත්ව යාමට නියමිත බවත් විදේශ සබඳතා අමාත්‍යාංශ ආරංචි මාර්ග සඳහන් කරයි. මෙම පිරිස මෙරට විවිධ රැකියාවල නිරතව සිටි සහ සංචාරක වීසා මත පැමිණ සිටි අය බවද පැවසේ.

ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයේ වෙබ් අඩවිය හරහා කළ දැනුම් දීමකට අනුව මෙම සියලු දෙනා අන්තර් ජාලය හරහා ලියාපදිංචිවී ඇති බවද ආරංචි මාර්ග කියයි. ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයේ ඉල්ලීම මත විදේශ සබඳතා අමාත්‍යාංශය මැදිහත් වී මෙම පිරිස රැගෙන යෑමට අවසර දී ඇත. මොවුන් පිරිස ජූනි මස 01 වැනි දින කොළඹ වරායෙන් පිටත්ව දකුණු ඉන්දියාවේ තූත්තුකුඩි වරාය වෙත යෑමට නියමිතව ඇත.

# ගාලු වරායේ ඇති නැවට සේවකයන් 43 ක් ගේන ගුවන් යානය අද මත්තලට

(සූරියවැව දිලිප් ජයසේකර)

ගාල්ල වරායේ නැංගුරම්ලා තිබෙන නෞකාවක සේවය සඳහා කාර්ය මණ්ඩලයේ 43 දෙනකු රැගත් බෝයිං 737-800 දරණ ගුවන් යානය අද (28) මත්තල රාජපක්ෂ ගුවන් තොටුපොළට ගොඩබෑමට නියමිත බව මත්තල රාජපක්ෂ ගුවන්තොටුපොළේ ප්‍රධාන කළමණාකරු උපුල් කලංසූරිය මහතා පැවසීය.

මෙම ගුවන් යානය බෙල්ජියමේ බ්‍රසල්ස් සිට මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළට පැමිණීමට නියමිත අතර ගාල්ල වරායේ දැනට නවතා තිබෙන නෞකාවකට කාර්ය මණ්ඩලයේ 43 දෙනකු මාරු කිරීමටත් එම නෞකාවේ දැනට සේවය කරන සේවකයන් 35 දෙනෙකු නැවත රැගෙන යාමටත් නියමිතය.

මෙහිදී ගුවන්තොටු පොළට පැමිණෙන සියලුම මගීන් විශේෂ නිරෝධායන ක්‍රියාවලියකට යොමු කිරීමෙන් පසු ගාල්ල වරායේ නැංගුරම් ලා තිබෙන නෞකාව වෙත රැගෙන යාමට නියමිත බව ගුවන්තොටුපොළ කළමනාකරු පැවසීය.

මත්තල රාජපක්ෂ ගුවන් තොටුපොළ මේ වන විට ජාත්‍යන්තර නැව්වල කාර්ය මණ්ඩල මාරු කිරීම හා ඒ හා අවශ්‍ය පහසුකම් සැපයීමේ වැදගත් ස්ථානයක් බවට පත් තිබේ. පසුගිය 3 වැනි දිනද ජාත්‍යන්තර නෞකාවක කාර්ය මණ්ඩලයේ 230 දෙනකු රැගත් විශේෂ ගුවන් යානයක් නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් නුවර සිට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටු පොළට පැමිණි අතර ගාල්ල වරායේ නවතා තිබූ නෞකාවේ සේවය අවසන් කළ කාර්ය මණ්ඩලයේ 53 දෙනෙක්ද මෙරටින් රැගෙන ගියහ.

පුවත්පත - අද     දිනය - 2020-05-29

# නෞකා කාර්යමණ්ඩලයක 43ක් රැගෙන ගුවන්යානයක් බෙල්ජියමේ බ්‍රසල්ස් සිට මත්තලට

## ගාල්ල වරායේ සිටි නෞකා කාර්ය මණ්ඩලයේ 35ක් බ්‍රසල්ස් බලා පිටත්ව යති

■ සූරියවැව - සුවත් ජයසේකර

ගාල්ල වරායේ නැංගුරම්ලා තිබෙන නෞකාවක කාර්යමණ්ඩලයේ 43 දෙනෙකු රැගෙන බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර සිට බෝයිං 737 දරන ගුවන්යානය ඊයේ (28දා) පෙරවරු 07.12ට මත්තල ගුවන්තොටුපොළට ළඟාවූ බව ගුවන්තොටුපොළ කළමනාකරු උපුල් කලංසූරිය මහතා පැවසීය.

ගාල්ල වරායේ නැංගුරම්ලා තිබෙන නෞකාවක් සඳහා නැව් කාර්යමණ්ඩලයේ 43 දෙනෙකු මාරු කිරීමට බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර සිට රැගෙන ආ අතර, දැනට නෞකාවේ සේවය කරන සේවකයන් 35 දෙනෙකු රැගෙන ගුවන්යානය නැවතත් බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර බලා පිටත්ව යාමට නියමිතය.

ලංකාවට පැමිණි සියලුම දෙනා ගුවන්තොටුපොළ තුළදීම විශේෂ නිරෝධායන ක්‍රියාවලියකට ලක්කිරීමෙන් පසු බස් රථ මගින් ගාල්ල වරාය වෙත රැගෙන යාමට කටයුතු කෙරුණි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ස්ථාපිත කර ඇති රසායනික, න්‍යෂ්ටික, ජීව විද්‍යාත්මක හා විකිරණශීලී ප්‍රතිචාර බළකායේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සියලු නිරෝධායන කටයුතු සිදුකෙරිණි.

සමුද්‍රීය හා ගුවන් සේවා කර්මාන්තය එකට සම්බන්ධවෙමින් ලෝකයම කොවිඩ් වෛරසයට ගොදුරුවූ අවස්ථාවක මත්තල රාජපක්ෂ ගුවන්



තොටුපොළ යොදාගෙන මෙලෙස මානුෂික මෙහෙයුම් සිදුකිරීමද විශේෂත්වයකි.

පුවත්පත - ලංකාදීප දිනය - 2020-05-30

# වරාය අධිකාරියේ මෙහෙයුම් කටයුතු ඇරැඹේ

## ක්‍රවුන් ප්‍රින්සස් මගී නෞකාව කේප්ටවුන් සිට කොළඹ වරායට




(ඔසානා උදයංගනී)

ශ්‍රී ලංකාව තුළ කොරෝනා වයිරස ව්‍යාප්තිය පාලනයවීමත් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ද සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇති අතර ඒ අනුව කොළඹ වරාය වෙත පෙරේද (28) සුඛෝපභෝගී මගී නෞකාවක් පැමිණියේය.

'ක්‍රවුන් ප්‍රින්සස්' නමැති ඇමෙරිකානු මගී නෞකාව 2,098 දෙනකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් ද සමඟ මෙසේ කොළඹ වරායට පැමිණ ඇති අතර එය මෙරටට පැමිණ ඇත්තේ දකුණු අප්‍රිකාවේ කේප්ටවුන් වරායෙහි සිට දින 15ක පමණ ගමනක් අවසන් කරමිනි.

එහි සිටින කාර්යමණ්ඩල සාමාජිකයින් විවිධ රටවල අය වන අතර ඔවුන් සිය රටවල් වෙත යැවීම ඊයේ (29) සිට ශ්‍රීලංකන් ගුවන් සේවයට අයත් ගුවන්යානා මගින් සිදුකෙරෙන බව වරාය අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පැවසීය.

මෙය විශේෂ අවසරයක් මත මාස ගණනාවක් රටරටවල සංචාරයක නිරත වූ නෞකාවක් බව ද එම නිලධාරියා සඳහන් කළේය.

පිලිපීන ජාතිකයින් 1,466ක්, ඉන්දියානු ජාතිකයින් 380ක්, ඉන්දුනීසියානු 113ක්, ඉතාලි 28ක්, චීන ජාතික 22ක් හා ඕස්ට්‍රේලියානු, යුක්රේන්, බල්ගේරියානු, ජපන්, දකුණු අප්‍රිකා ආදී රටවල් 28ක වැසියන් මෙම නෞකාවේ කාර්ය මණ්ඩලය ලෙස කටයුතු කරන අතර එය කාමර දෙදහසකට වැඩි ප්‍රමාණයකින් සමන්විතය.

මේ කාර්ය මණ්ඩලය අතරින් ඉන්දියානු ජාතිකයින් 310 දෙනකු ශ්‍රීලංකන් ගුවන් සමාගමට අයත් විශේෂ ගුවන් යානයකින් ඊයේ (29) සියරට බලා පිටත්ව ගිය බවද එම නිලධාරියා පැවසීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති, විශ්‍රාමික යුද හමුදාපති, ජෙනරාල් දයා රත්නායක යන මහත්වරුන්ගේ උපදෙස් මත ආගමන විගමන පාලක ජනරාල් සරත් රූපසිරි, නියෝජ්‍ය පාලක කේසී ප්‍රනාන්දු සහ තොටුපළ හා වරාය භාර සහකාර පාලක ජයන්ත රත්නායක යන මහත්වරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම කටයුතු සිදුකෙරේ.

සෞඛ්‍ය ශිරිසද ඉදිරියේදී ගුවන් මගින් සිය රටවල් බලා පිටත්කිරීමෙන් අනතුරුව නෞකාව ඇමෙරිකාව බලා ගමන් අරඹනු ඇතැයි ද එම නිලධාරියා පැවසීය.

මෙම මෙහෙයුම් කටයුතු සෞඛ්‍ය අංශවල උපදෙස් අනුව ඉතා ආරක්ෂාකාරී අයුරින් සිදුවන බව කී හෙතෙම එහි නිශ්කාෂණ කටයුතු හා බැඳුම්කර ලබාගැනීම සිදුකරන්නේ ද ආගමන විගමන නිලධාරීන් පිරිසක් නෞකාව තුළට ගොස් බව ප්‍රකාශ කළේය.

### ලබන ඉරිදා තවත් නැව කොළඹ වරායේ

ඒ අනුව විශේෂිත ආරක්ෂක ඇඳුම්වලින් සැරසුණු නිලධාරීන් හය දෙනකු සමඟ තමන් ද වරාය භාර නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය රොෂාන් සම්පත් මහතාගේ අධීක්ෂණය යටතේ මෙම කටයුතු සිදුකළ බවද ඔහු කීවේය.

මෙවැනි තවත් නෞකාවක් ලබන 31 වැනිදාත් කොළඹ වරායට පැමිණෙන බව හෙතෙම පැවසීය.

කොරෝනා වසංගතය සමඟ ලෝකය මුහුණ පා ඇති තත්ත්වය හමුවේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ගුවන් සේවය විසින් කරන මෙම කාර්යය මානුෂීය මෙහෙයුමක් බවද ඔහු පැවසීය.

මෙයින් ශ්‍රී ලංකාවට ආදායමක් මෙන්ම මෙවැනි මානුෂීය මෙහෙයුමක් තුළින් ලෝකය තුළ ශ්‍රී ලංකාව ගැන යහපත් ප්‍රතිරූපයක් ද ගොඩනැගෙන බව ජ්‍යෙෂ්ඨ නිලධාරියා සඳහන් කළේය.

නෞකාව තුළට ගොස් එහි නිශ්කාෂණ කටයුතු හා බැඳුම්කර ලබාගැනීම සිදුකරන ආගමන විගමන නිලධාරීන් අතරට නිලධාරිනියන් දෙදෙනකුද ඇතුළත් වන අතර රංග විජේසිංහ, ශනුක් රාජපක්ෂ, සම්පත් වීරසේන, මොහොමඩ් රියාස් යන නිලධාරීන් හා සුප්‍රියා සොයිසා, සුධීරා කත්‍රිආරච්චි යන නිලධාරිනියන් එම කටයුතු සිදුකර තිබේ.

CLIPPINGS

පුවත්පත - රාවය        දිනය - 2020-05-31

# වරායේ වෘත්තීය ගැටලු

**ලෝරන්ස් ෆර්ඩිනැන්ඩු**

සේවා මුරයට නොපැමිණෙන සේවකයන්ගේ පුද්ගලික නිවාඩු අඩු කිරීමට පාලනාධිකාරිය ගෙන ඇති තීරණය හේතුවෙන් සේවකයන් දැඩි කණස්සල්ලට පත්ව තිබෙන අතර 2020/05/22 දිනැතිව වඅධි/ප්‍ර01/විවිධ/2020 චක්‍රලේඛය අහෝසි කරන මෙන් ➜ 2 පිටුවට

## වරායේ වෘත්තීය ...

ඉල්ලමින් සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතිය එහි සභාපතිවරයාගෙන් ඉල්ලා ඇත.

ඒ පිළිබඳව අදහස් දක්වමින් එම සමිතියේ ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි මහගමගේ පැවසුවේ සේවා මුර ක්‍රමයට සේවයට වාර්තා කරන සේවකයන්ට ප්‍රවාහන අපහසුතා හේතුවෙන් සේවයට නොපැමිණි විට ඒ සඳහා නිවාඩු ඉල්ලුම් කිරීමට පාලන අධිකාරිය කරනු ලබන ඉල්ලීම අසාධාරණ හෙයින් ඒ සම්බන්ධයෙන් සාධාරණ විසඳුමක් ලබා ගැනීම සඳහා පාලනාධිකාරියෙන් ඉල්ලා තිබෙන බවය.

මේ ගැන විමසූ විට වරාය අධිකාරියේ සභාපති විශ්‍රාමික හමුදාපති ජෙනරාල් දයා රත්නායක පැවසුවේ කිසිවකුට හෝ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඒ පිළිබඳව පැමිණිලි කිරීමේ අවස්ථාව ලබාදී තිබෙන බවත් එම ගැටලු ආයතන ප්‍රධානීන් සමග සාකච්ඡා කර විසඳුමකට එළැඹීමට කටයුතු කිරීමට අපේක්ෂා කරන බවය.

මේ වන විට වරාය සේවක පිරිස් කොටස් හතරක් යටතේ සේවය කරනු ලැබුවද වරායේ කටයුතු අඩුපාඩුවකින් තොරව කරගෙන යන බවද ඔහු කීය. ■

CLIPPINGS

Communication and Public Relations Division
Sri Lanka Ports Authority
No 19, Chaithya Road,
Colombo 01
Sri Lanka

for more details: news.slpa.lk